# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2255/24 - 2021 නොවැම්බර් මස 24 වැනි බදාදා - 2021.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ජනාධිපති නීතිඥවරුන් පත්කිරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ**

ජනා.කා. අංකය: පීඑස්/සීඑස්ඒ/00/2/48

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(ඉ) ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ජනාධිපති නීතිඥවරුන් පත්කිරීමේ දී, අදාළ වන අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද මතු සඳහන් මාර්ගෝපදේශයන් මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

2021 නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**ජනාධිපති නීතිඥයින් පත් කිරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ**

01. මෙම මාර්ගෝපදේශයන් ජනාධිපති නීතිඥවරුන් පත් කිරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ ලෙස හඳුන්වනු ලැබේ.

02. i. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වන;

ii. නීතිඥ වෘත්තියේ විශිෂ්ටත්වයට පත්ව ඇති සහ පැවැත්මේ සහ වෘත්තීය කටයුතු පිළිබඳ අවංකභාවයෙහි උත්කෘෂ්ට තත්ත්වයක් පවත්වාගෙන යන;

iii. (අ) ශ්‍රී ලංකාවේ ඕනෑම අධිකරණයක නීති තර්ක තුළින් සක්‍රීය දායකත්වයක් ලබා දී ඇති; හෝ
(ආ) නීතියේ උන්නතිය උදෙසා නීති තර්ක තුළින් සක්‍රීය දායකත්වයක් ලබා දී ඇති; හෝ
(ඇ) රාජ්‍ය අංශයේ හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ජාත්‍යන්තරව පිළිගත් ආයතනයක හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නීති විෂයයෙහි විශේෂඥයකු ලෙස සුවිශේෂී සහ විශිෂ්ට දායකත්වයක් ලබා දී තිබීම හෝ ශ්‍රී ලංකාවට කීර්තියක් හෝ ගෞරවයක් අත්කර දී ඇති;

iv. සෑම අවස්ථාවකදී ම යහපත් චරිතයකින් සහ කීර්තිනාමයකින් යුක්ත වන;

v. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කර නොමැති;

vi. නීතියේ ආධිපත්‍යයට හෝ අධිකරණයේ ස්වාධීනත්වයට හානි පමුණුවන හෝ බිඳ හෙලන කිසිදු ක්‍රියාවක නිරත වී නොමැති;

vii. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හෝ ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් විනය නියෝගයකට ලක්කර නොමැති සහ අධිකරණයක් විසින් වෘත්තීමය පැහැර හැරීමක් හෝ අකටයුත්තක් සඳහා වරදකරු කර නොමැති සහ බුන්වත් නොවූ සහ අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වරදකරු නොවූ සහ රථ වාහන ආඥාපනත යටතේ සුළු වරදකට හැර දේශීය හෝ විදේශීය අධිකරණයක් විසින් කිසිදු වරදකට වරදකරු කර නොමැති;

viii. ජනාධිපති නීතිඥවරයෙකු ලෙස පත්වීම සඳහා වූ අයදුම්පත ඔහු / ඇය ඉදිරිපත් කිරීමට පෙර, අවම වශයෙන් අවුරුදු පහක කාලයක් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ, ආදායම් බදු ගෙවන්නෙකු වශයෙන් ලියාපදිංචි වී ඇති;

පුද්ගලයෙකු හැර වෙනත් කිසිවෙකු ජනාධිපති නීතිඥයෙකු ලෙස පත් නොකළ යුතුය.

03. නීතිය සහ/හෝ නීති පද්ධතිය පිළිබඳ ග්‍රන්ථ, ලේඛන ප්‍රසිද්ධ කර තිබීම, ජාතික හෝ ජාත්‍යන්තර සමුළු සඳහා පත්‍රිකා ඉදිරිපත් කර තිබීම, ජාතික හෝ ජාත්‍යන්තරව පිළිගත් ආයතන මගින් නීතිය පිළිබඳ වැඩිදුර හදාරා තිබීම, පිළිගත් උසස් අධ්‍යාපන ආයතන තුළ නීති විෂයය උගන්වා තිබීම, නීතියේ නව අවකාශයන් පිළිබඳ යාවත්කාලීන වූ දැනුම සහිත වීම සහ අර්ථවත් ලෙස වෘත්තියට දායකත්වය සපයන කනිෂ්ඨ නීතිඥවරුන් පුහුණු කර තිබීම, ජනාධිපති නීතිඥයන් පත්කිරීමේදී අමතර සුදුසුකමක් ලෙස සළකන අතර නොතාරිස්වරයකු ලෙස සේවයේ යෙදී සිටීම නුසුදුසුකමක් ලෙස සළකනු ලැබේ.

04. ඔහු / ඇය අවම වශයෙන් වසර විස්සක (20) කාලයක් තුළ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයෙකු වශයෙන් කටයුතු කර නොමැතිනම් ජනාධිපති නීතිඥයෙකු වශයෙන් පත් නොකළ යුතුය. කෙසේ වෙතත්, විශේෂිත අවස්ථාවන්හි දි අනෙකුත් සියළුම නිර්ණායකයන් සපුරා ඇති, වසර පහළොවක (15) සේවා කාලයක් සහිත ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයන් ද ජනාධිපති නීතිඥයන් ලෙස පත්කිරීමට සළකා බැලිය හැකිය.

05. ජනාධිපති නීතිඥයන් පත්කිරීම උපරිම වශයෙන් වසරකට එක් කණ්ඩායමකට සීමා කළ යුතුය.

06. වසරකට පත්කරනු ලබන ජනාධිපති නීතිඥයන් ගේ සංඛ්‍යාව දහය (10) නොඉක්මවිය යුතුය.

07. ජනාධිපති නීතිඥවරයකු ලෙස පත්වීම නීතිඥවරයකුගේ අයිතිවාසිකමක් ලෙස නොසැළකිය යුතුය.

08. නිල තත්ත්වය පදනම් කර ගෙන ජනාධිපති නීතිඥවරුන් ලෙස පත්වන රජයේ නීති නිලධාරීන්ට මෙම මාර්ගෝපදේශයන් අදාළ නොවේ.

09. තහවුරු කර ගැනීමේ ක්‍රියාවලියකින් පසුව ජනාධිපති නීතිඥයින් ලෙස පත්කිරීමට යෝජිත පුද්ගලයින් පිළිබඳව අග්‍රවිනිශ්චයකාරවරයා ගේ සහ නීතිපතිවරයා ගේ මතය ජනාධිපතිවරයාට විමසිය හැකිය.

10. අයදුම්කරු විසින් කෙළින්ම හෝ වක්‍රව තුන්වන පාර්ශවයක් මගින් අදාළ අයදුම්පත සම්බන්ධව හෝ ජනාධිපති නීතිඥවරයෙකු වශයෙන් පත් කිරීම සම්බන්ධව කිසිදු බලපෑමක් කිරීම නුසුදුසුකමක් ලෙස සළකනු ඇත.

11. යම් අයදුම්කරුවෙකු විසින් තම අයදුම්පත මගින් සාවද්‍ය තොරතුරු ලබා දීමක් හෝ කූට ලේඛන ඉදිරිපත් කිරීමක් හෝ කරුණු වසන් කිරීමක් සිදු කර ඇති විට එම ඉල්ලුම් පත්‍රය එනයින්ම ප්‍රතික්ෂේප වූ ලෙස සළකනු ලැබේ.

12. ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන සියලුම ජනාධිපති නීතිඥවරුන්ගේ නම් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන අතර, එම තොරතුරු ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවියේ ද පළ කරනු ලැබේ.

13. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනයක් දක්වමින්, ජනාධිපති නීතිඥයන් පත්කිරීම සඳහා අදාළ අයදුම්පත් රජයේ ගැසට් නිවේදනයක් මඟින් කැඳවනු ලැබේ. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

14. 2019.10.29 දිනැතිව නිකුත් කරන ලද අංක 2147/37 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කරන ලද ජනාධිපති නීතිඥයන් පත්කිරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ මෙයින් අවලංගු කරනු ලැබේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.